# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 10 වන පාඩම - ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය

**සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර** **කෑ / දෙහි කිතලංගමුව ක . වි**

- නිපුණතාවය - රටක විදේශ ආධිපත්‍යය ගොඩනැගීම සඳහා බලපාන සාධක බටහිර ජාතීන් ශ්‍රී ලංකාවේ බලය පිහිටුවා ගැනීම ඇසුරින් විමර්ශනය කරයි.
- නිපුණතා මට්ටම - 10 . 1 තාක්ෂණික ආධිපත්‍යය හා තාන්ත්‍රික උපක්‍රම මගින් පෘතුගීසීන් හා ලන්දේසීන් බලය ව්‍යාප්ත කළ ආකාරය පහදයි.
- විෂය සන්ධාරය - ශ්‍රී ලංකාව හා බටහිර ලෝකය
- ඉගෙනුම් ඵල - • පෘතුගීසීන් හා ලන්දේසීන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල බලය පිහිටුවාගත් ආකාරය පැහැදිලි කරයි.
- ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

දුවේ පුතේ ඔබ 8 ශ්‍රේණියේ දී සහ 9 ශ්‍රේණියේ දී ශ්‍රී ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි පාලන සමය පිළිබඳව අධ්‍යනය කරනු ලැබූහ. අද අපි මෙම පාඩමෙන් ඒ පිළිබඳව තව දුරටත් අධ්‍යනය කරමු. ඔබ කලින් ශ්‍රේණිවල දී ඉගෙනගත් කරුණු ද සමග සංසන්දනය කරමින් එම දැනුම හා අවබෝධය තව දුරටත් පුළුල් කර ගැනීමට මෙම පාඩමේ ඇති තොරතුරු ද උපයෝගී කර ගන්න.

ඒ අනුව ඔබ ලබා ගත් දැනුම උපයෝගී කර ගනිමින් 10 ශ්‍රේණියේ පෙළපොත හොඳින් අධ්‍යනය කර පහත ක්‍රියාකාරකම්වල යෙදෙන්න.

(1) පෘතුගීසීන් ශ්‍රී ලංකාව කෙරෙහි සිය අවධානය යොමු කිරීමට බලපෑ හේතු මොනවා ද?

(2) පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට මෙරට පැවැති ප්‍රධාන රාජධානි තුන ලියා එහි පැවති දේශපාලන තත්ත්වය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

(3) විජයබා කොල්ලය යනු කුමක් දැයි හඳුන්වා එහි ප්‍රතිඵල ලියා දක්වන්න.

(4) පෘතුගීසීන් කෝට්ටේ රාජධානිය කෙරෙහි සිය අවධානය යොමු කිරීමට බලපෑ හේතු ලියා දක්වන්න.

(5) පෘතුගීසීන් සහ බුවනෙකබාහු රජු අතර ගැටුම් ඇති වීමට බලපෑ හේතු මොනවා ද?

(6) කෝට්ටේ රාජධානිය පෘතුගීසීන්ට අත්පත් වීම කෙරෙහි බලපෑ හේතු මොනවා ද?

(7) පහත සඳහන් ස්ථාන ලෝක ස්ථාන ලෝක සිතියමක ලකුණු කර නම් කරන්න.

කැලිකට් , සුබපැතීමේ තුඩුව , ගෝව , කොචින් , පොන්ඩිචෙරි , මදුරාසිය , කල්කටා , බාතාවිය , මලක්කා සමුද්‍ර සන්ධිය , ජාවා දූපත , සමුද්‍රා දූපත

- **ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කරගත හැකි පොත්පත් , වෙබ් අඩවි සහ ඉගෙනුම් ආධාරක**

**දුවේ , පුතේ පහත පොත් පත් හා වෙබ් අඩවි පරිශීලනය කිරීමෙන් ඔබට මෙම ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.**

1) e - තක්සලාව

2) e - නැණ පියස - http:/ www. enenapiyasa.lk

3) You tube නාලිකාවේ ශ්‍රී ලංකාවේ පෘතුගීසි හා ලන්දේසි පාලනයට අදාල මාතෘකා ඔස්සේ ඇති ඇති තොරතුරු , රූප සටහන් සහ සිතියම්.

4) පොත්පත් -

8 , 9 සහ 10 ශ්‍රේණිය පෙළපොත් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

අ . පො . ස ( උ . පෙළ ) ශ්‍රී ලංකා ඉතිහාසය III කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

ශ්‍රී ලාංකිය ඉතිහාසය III වෙළුම - ඇම් . ඩී . ගුණසේන සහ සමාගම

ලංකාවේ ලන්දේසි බලය - ආචාර්ය එස්. අර්සරත්ගම්

ශ්‍රී ලංකාවේ ලන්දේසි බලය පිහිටුවීම - ආචාර්ය කේ . ඩබ් . ගුණවර්